# KEY FACT DOCUMENT
# රන් සුරැකුම් පහසුකම

| | |
|---|---|
| සුදුසුකම් | ශ්‍රී ලංකාවේ පදිංචි අවුරුදු 18 සහ ඊට වැඩි පුද්ගලයන් |
| සේවාවෙහි ස්වභාවය | රන් සුරැකුම් පහසුකම යනු ඔබේ රන් භාණ්ඩ භාවිතා කරමින් ඔබේ හදිසි මුදල් අවශ්‍යතා සපුරාගැනීමට අවස්ථාව සලසා දෙන සුවිශේෂී මානුෂ හිතවාදී බැංකු සේවාවකි. ගනුදෙනුකරුවෙකු මෙම පහසුකම ලබාගැනීම සඳහා රන් භාණ්ඩ රැගෙන ආ විට එම භාණ්ඩ සියල්ල සංශුද්ධතාව සහ බර සම්බන්ධ පරීක්ෂාවන්ට ලක්කෙරේ. ඉන් අනතුරුව බැංකුව විසින් 'රන් සුරැකුම් සහතිකයක්' නිකුත් කරනු ලබන අතර, එම සහතිකය තුළ අදාළ භාණ්ඩවල විස්තර, ගුණාත්මකභාවය, ප්‍රමාණය, වෙළඳපළ වටිනාකම සහ සුරැකුම් ගාස්තුව යනාදී තොරතුරු සඳහන් වනු ඇත. භාරකාර ගාස්තුව මාස 12 ක කාලයක් සඳහා අය කරනු ලබන අතර, ඉන් පසුව නව තක්සේරුවේදී භාණ්ඩ ආපසු ගැනීමට හෝ තවත් මාස 12 ක කාලයක් සඳහා අලුත් කිරීමට හැකියාව ඇත. අවශ්‍ය නම් මාස 12 අවසන් වීමට පෙර රන් භාණ්ඩ ආපසු ලබාගත හැකි අතර, එවැනි අවස්ථාවකදී රන් භාණ්ඩ බැංකුව භාරයේ තිබූ කාලසීමාව සඳහා භාරකාර ගාස්තුව ගණනය කෙරේ. හදිසි අවශ්‍යතාවකදී මුදල් ලබා ගැනීම සඳහා සහතිකය ඇපයට තැබීමේ හැකියාව ඇත. |
| මූලික ලක්ෂණ | • තැන්පතු අවශ්‍ය නොවේ<br>• තරගකාරී භාරකාර ගාස්තු<br>• වසර 1ක් දක්වා සුරැකුම් කාලය<br>• සුරැකුම් පහසුකම ලබාගත් රත්‍රන් සඳහා නොමිලේ Takaful ආවරණයක්<br>• හදිසි අවශ්‍යතාවකදී රන් සුරැකුම් සහතිකය ඇපයට තබා අමානා බැංකුවෙන් මුදල් ලබාගැනීමේ හැකියාව |
| අවශ්‍ය ලිපිලේඛන | • ජාතික හැඳුනුම්පත/වලංගු විදේශ ගමන් බලපත්‍රය/රියදුරු බලපත්‍රය<br>• වටිනාකම් තක්සේරුව සඳහා රන් භාණ්ඩ<br>• සම්පූර්ණ කරන ලද රන් සුරැකුම් පහසුකම් අයදුම්පත<br><br>අයදුම්පත ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙතින් ලබාගන්න. නැතිනම් මෙම වෙබ් ලිපිනය තුළින් බාගත කරගන්න: https://www.amanabank.lk/application-downloads.html |
| ගාස්තු | දැනට ක්‍රියාත්මක වන ගාස්තු අපගේ නිල වෙබ් අඩවියෙහි දක්වා තිබේ: |

| | |
|---|---|
| | https://www.amanabank.lk/tariff-services.html |
| නියමයන් හා කොන්දේසි | සේවාවන් සම්බන්ධ තොරතුරු සහ නියමයන් හා කොන්දේසි කලින් කලට වෙනස් වීමට ඉඩ ඇත. එම නිසා නවතම තොරතුරු සහ නියමයන් හා කොන්දේසි දැනගැනීම සඳහා ළඟම පිහිටි අමානා බැංකු ශාඛාව වෙත යන්න. නැතිනම් අපගේ නිල වෙබ් අඩවියට පිවිසෙන්න. https://www.amanabank.lk/pdf/application-downloads/general-business-conditions.pdf |
| ප්‍රතිචාර සහ පැමිණිලි | ඔබගේ ප්‍රතිචාර සහ පැමිණිලි පැය 24 පුරා ක්‍රියාත්මක අපගේ පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානය වෙත යොමුකරන්න. අපගේ නියෝජිතයන් ඔබට අවශ්‍ය සහයෝගය නොපමාව ලබාදෙනු ඇත.<br><br>පාරිභෝගික විසඳුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය: +94 11 7 756 756<br>ඊමේල් : info@amana.lk \| feedback@amana.lk<br><br>ඔබගේ විමසීම් අපගේ වෙබ් අඩවිය හරහා යොමුකරන්න: www.amanabank.lk<br><br>කෙසේ නමුත් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම් ඒ බව ලිපියක් හෝ විද්‍යුත් ලිපියක් (ඊමේල්) මඟින් අප වෙත දැනුම් දෙන්න:<br>කළමනාකරු - සේවා තත්ත්ව සහතිකකරණ<br>අමානා බැංකුව අංක 485, ගාලු පාර, කොළඹ 03<br>ඊමේල්: servicequality@amana.lk |
| | ඉහත සඳහන් ක්‍රම මඟින් ඔබගේ අවශ්‍යතාව ඉටු නොවූයේ නම්, ඔබට ස්වාධීන මූල්‍ය ඔම්බුඩ්ස්මන්වරයාගේ සේවාව ලබාගත හැක.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලයේ සම්බන්ධතා තොරතුරු පහත දැක්වේ.<br><br>මූල්‍ය ඔම්බුඩ්ස්මන්,<br>අංක 01, බෙතෙස්ඩා පෙදෙස, මිලාගිරිය, කොළඹ 04<br><br>දුරකථන: + 94 11 2595624 ෆැක්ස්: +94 11 2595625 |